# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2269/72 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වන විරෝධතාවයන් 2022 මාර්තු මස 25 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2022 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

*උපලේඛනය*

ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද,

1A - G 36270 — 15 (2022/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අවසන් වරට 2018 ජූලි මස 26 වන දින අංක 2081/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, එකී උපලේඛනයෙහි ii වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II කොටස*

කම්කරුවන්ගේ පන්තිය

(i) (අ) වැනි ශ්‍රේණිය : මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මසන්නෝ, ඩිසයින් පන්ච් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ

(ආ) වැනි ශ්‍රේණිය : ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලකවරු

(ii) වැනි ශ්‍රේණිය : ඇඳුම් කපන්නෝ (අතින්), ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත්වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ

(iii) වැනි ශ්‍රේණිය : හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ, විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන ගැහැණු කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ, මැෂින්/අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ

(iv) වැනි ශ්‍රේණිය : රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අසුරන්නෝ, සෙලෝපේන් මළු හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ

(v) වැනි ශ්‍රේණිය : ආධුනිකයන් හා පුහුණුවන්නන්

ඉහත සඳහන් යම් වෘත්තීය ආධුනිකයෙකුගේ හෝ පුහුණුවන්නකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156කින් යුක්ත විය යුතුය.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | *කම්කරුවන්ගේ පන්තිය* | | | | | |
|---|---|---|---|---|---|---|
| | *I (අ) ශ්‍රේණිය රු. ශත* | *I (ආ) ශ්‍රේණිය රු. ශත* | *II ශ්‍රේණිය රු. ශත* | *III ශ්‍රේණිය රු. ශත* | *IV ශ්‍රේණිය රු. ශත* | *V ශ්‍රේණිය රු. ශත* |
| 1 සේවා වර්ෂය | 15,875.00 | 15,275.00 | 13,760.00 | 13,650.00 | 13,000.00 | 8,125.00 |
| 2 සේවා වර්ෂය | 16,075.00 | 15,450.00 | 13,910.00 | 13,775.00 | 13,100.00 | |
| 3 සේවා වර්ෂය | 16,275.00 | 15,625.00 | 14,060.00 | 13,900.00 | 13,200.00 | |
| 4 සේවා වර්ෂය | 16,475.00 | 15,800.00 | 14,210.00 | 14,025.00 | 13,300.00 | |
| 5 සේවා වර්ෂය | 16,675.00 | 15,975.00 | 14,360.00 | 14,150.00 | 13,400.00 | |

EOG 03-0756/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දක්වන විරෝධතාවයන් 2022 මාර්තු මස 25 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාව.

2022 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ 05,
''මෙහෙවර පියෙස'',
කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

*උපලේඛනය*

පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1999 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 1099/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2018 සැප්තැම්බර් මස 25 වන දින අංක 2090/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ, එම උපලේඛනයට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II කොටස*

**සේවකයන්ගේ පන්තිය**

**පුහුණු**

අංශ නියාමකයින්, විවිධ යන්ත්‍ර ක්‍රියා කරවන්නන්, මෝස්තර අඳින්නන්, චාර්ජ් හැන්ඩ්ලර්වරුන්, දහන යන්ත්‍ර ක්‍රියාකරුවන්, උදුන් ක්‍රියාකරවන්නන්, ජ්‍යෙෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, අච්චු ශිල්පීන්, පර්යේෂණ සහායකයන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්, හරි වැරදි බලන්නන්, විදුලි කාර්මිකයින්.

**අර්ධ පුහුණු**

සහකාර අච්චු ශිල්පීන්, වර්ණ ගන්වන්නන් (ස්ප්‍රේ කරන්නන් සහ ඩිපර්ස්) තෝරන්නන්, කණිෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, පොලිෂ් කරන්නන්, අසුරන්නන්, නිෂ්පාදන සුද්ද කරන්නන්, ස්ටිකර් අලවන්නන්, ෂවල් ලෝඩර් ඔපරේටර්, සහකාර යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකරු, උදුන් සහායක ක්‍රියාකරු.

**නුපුහුණු**
පිරිසිදු කරන්නන්, අත් උදව්කරුවන්, සාමාන්‍ය වැඩකරුවෝ, වතුවැඩ කරන්නන් සහ වෙනත් අනුශාංගික සේවාවල නිරතවන්නන්

**ආධුනිකයින්**

අවුරුදු දෙකක පුහුණු කාල සීමාවකට යටත්ව විවිධ කාර්යයන්හි වැඩ ඉගෙන ගන්නා අය.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *පුහුණු රු. ශත* | *අර්ධ පුහුණු රු. ශත* | *නුපුහුණු රු. ශත* | *ආධුනිකයින් රු. ශත* |
|---|---|---|---|---|
| 1 වන වර්ෂය | 15,500.00 | 14,500.00 | 13,500.00 | 8,215.00 |
| 2 සේවා වර්ෂය | 15,680.00 | 14,625.00 | 13,600.00 | 8,315.00 |
| 3 සේවා වර්ෂය | 15,800.00 | 14,750.00 | 13,700.00 | |
| 4 සේවා වර්ෂය | 15,950.00 | 14,875.00 | 13,800.00 | |
| 5 සේවා වර්ෂය | 16,100.00 | 15,000.00 | 13,900.00 | |

EOG 03-0756/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.